**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2018 හා 2019**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2018 සහ 2019 වර්ෂවල මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2018 සහ 2019 වර්ෂවල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**02. විගණන නිරීක්ෂණ**

---

**2.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම.**

---

| | නීති රීති, රෙගුලාසි විධිවිධානවලට යොමුව | විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත** | | | |
| (i) | **(4) (ඇ) වගන්තිය** | අරමුදල සතු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා ද අරමුදලේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට පාලක මණ්ඩලය විසින් කෙලින්ම හෝ පාලක මණ්ඩලය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයන් විසින් එළඹිය හැකි වුවද ඊට පටහැනිව අරමුදලේ | පිළිතුරු එවා නොමැත | අරමුදල පනතේ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රධාන පරිපාලන නිලධාරියාගේ අනුමැතිය මත අරමුදලේ අධ්‍යක්ෂ පාලන හා මානව සම්පත් සංවර්ධන විසින් සෙත්සිරිපාය II අදියරේ "ඩී" පර්යන්තයේ අරමුදලේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් 2019 පෙබරවාරි 13 දින ගිවිසුම අත්සන් කර තිබුණි. | | |
| **(ii)** | **04 (උ) උපවගන්තිය** | සංස්කෘතික ත්‍රිකෝණය තුල හෝ හැර සංස්කෘතික ස්මාරක සංවර්ධනය, ආගමික කටයුතු ප්‍රවර්ධනය,ආගම නංවාලීම හා ආගමික වත්පිළිවෙත් නංවාලීම, සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයෙහි සේවය කළ තැනැත්තන්ට ප්‍රදාන පිරිනැමීම සහ කලාකරුවන්ට ආධාර කිරීම යනාදී පරමාර්ථ ඉටුකරගැනීම සඳහා අරමුදල විසින් ආරම්භයේ සිට මේ වනතෙක් ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපරිපාටිය සහිත රීති සකස් කර නොතිබුණි. | පිළිගනිමි | අරමුදල පනතේ සඳහන් පරමාර්ථ ඉටුකරගැනීම සඳහා රීති සකස් කල යුතුය. |
| **(iii)** | **8 (ඇ) උපවගන්තිය** | විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 හා 2019 වර්ෂ තුල ක්‍රියාකර නොතිබුණි. | පිළිගනිමි | විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පනතේ 4 (උ) අනුව අවශ්‍ය රීති සම්පාදනය කර එම කටයුතු ක්‍රියාත්මක කිරීම පාලක මණ්ඩලයේ වගකීමක් වේ. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i)** | **මු.රෙ. 139 (4), මු.රෙ. 139 (5) හා මු.රෙ. 389** | විධිමත් කුවිතාන්සියක් ලබාගැනීමෙන් තොරව, මුදල් ගෙවීමේදී හා චෙක්පත් භාරදීමේදී අදාල ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු | ආදාහන කටයුතු හා පෙරහැර මංගල්‍ය සඳහා කඩිනමින් මූල්‍යාධාර | චෙක්පත් ලිවීමේදී හා අදාළ චෙක්පත් භාරදීමේදී මුදල් රෙගුලාසි |

| | | | | |
|---|---|---|---|---|
| | | කරනොගෙන ආගම නංවාලීම සහ ආගමික ස්ථාන හා ආගමික වත්පිළිවෙත් පවත්වා ගෙනයාම සඳහා 2019 වර්ෂය තුලදී අවස්ථා 37 කදී ප්‍රාදේශීය ලේකම්වරු හා බාහිර පාර්ශවයන් වෙත රු.9,718,179 ක වටිනාකමැති ආධාර මුදල්වලට අදාළ චෙක්පත් රේඛීය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවකයින් වෙත ලබාදීමට අරමුදල විසින් කටයුතු කර තිබුණි. | සැපයිය යුතු බැවින් අමාත්‍යාංශ නිළධාරීන් අත චෙක්පත් යැවීමට කටයුතු කර ඇත . | ප්‍රකාරව කටයුතු කල යුතු අතර අදාළ මුදල් ආදායකයාගේ ගිණුමට බැරකිරීමට කටයුතු කල යුතුය. |
| **(ii)** | **මුදල් රෙගුලාසි 881** | ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියෙකු පත් කිරීමේදී හෝ එවැනි තනතුරකට මාරු කිරීමේදී එකී නිලධාරියා විසින් එම තනතුරට පත්කල දින සිට දෙමසක් ඇතුළතදී ඇප තැබීම සිදු කළ යුතු වුවත් 2018 මාර්තු සහ මැයි මාසයන්හි බඳවා ගන්නා ලද ප්‍රවේශපත්‍ර අලෙවිකරුවන් 11 දෙනෙකු 2019 ජනවාරි 25 දින වන විටත් ඇප තැන්පත් කර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කල යුතු අතර මේ සම්බන්ධයෙන් සිදුවිය හැකි වංචාවන් අනාවරණය කරගැනීම සඳහා ගතහැකි වෙනත් විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමුකළ යුතුය. |
| **(ඇ)** | **ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තිය** | රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දින වන විට අරමුදල විසින් අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් 03 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පිළිතුරු එවා නොමැත | රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු නැවත සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) (i) | **රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 8.3.3 (ඉ)** | ප්‍රසාද දීමනා ගෙවීමේදී ව්‍යාපෘතිවල නිලධාරීන්ගේ නිවාඩු හා වැටුප් රහිත නිවාඩු විස්තරවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව දීමනා ගෙවා තිබුණි. | පිළිතුරු නොමැත | එවා | ප්‍රසාද දීමනා ගෙවීමේදී නිලධාරීන්ගේ නිවාඩු හා වැටුප් රහිත නිවාඩු විස්තරවල නිරවද්‍යතාවය වගකිව යුතු නිළධාරියෙකු විසින් තහවුරු කල යුතුය. |
| (ii) | **2015 මැයි 25 දිනැති අංක PED1/2015 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ 4 උප වගන්තිය** | නිල වාහනයක් අනුයුක්ත කිරීමට සුදුසුකම් නොලබන වැටුප් කේතය MM-1-2 වූ තනතුරට බඳවාගත් නිලධාරීන් 05 දෙනෙකු සඳහා බඳවාගත් දින සිට සේවය අවසන් කල දින දක්වා මෙකී චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව රු.2,797,890 ක් ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි. | පිළිතුරු නොමැත | එවා | නිල වාහනයක් අනුයුක්ත කිරීමට සුදුසුකම් නොලබන නිලධාරීන්ට ගෙවා ඇති ඉන්ධන හා ප්‍රවාහන දීමනා නැවත අයකර ගත යුතුය. |
| (iii) | **1994 ජුනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛයේ 02 ඡේදය** | අරමුදල විසින් වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු, ගිණුම් කටයුතු, විශේෂ ප්‍රදර්ශන, පොත් හා අනුරූ අලෙවි කටයුතු වලට අදාලව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පාලක මණ්ඩල අනුමැතිය මත දීමනා ගෙවා තිබුණි. | පිළිතුරු නොමැත | එවා | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතව අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | **2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 01 ඡේදය හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛයේ 4 ඡේදය** | ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන්ගේ කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව 2018 වර්ෂය අරමුදලේ සේවකයින් හා නිළධාරීන්ට වැටුප්, අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | පිළිතුරු නොමැත | එවා | ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කර ගෙන වැටුප්, අතිකාල සහ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නිවාඩු දින වැටුප් ආදිය ගෙවිය යුතුය. |
| **(ඊ)** | **කළමනාකරණ විගණන චක්‍රලේඛ**<br>**2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009 (I) (i) දරන චක්‍රලේඛය හා 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01- 2019 දරන චක්‍රලේඛය** | අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් අරමුදල විසින් 2018 වර්ෂය සඳහා රැස්වීම් 02 ක්ද 2019 වර්ෂය සඳහා එක් කමිටු රැස්වීමක්ද පමණක් පවත්වා තිබුණි. | පිළිතුරු එවා නොමැත | අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| **(උ)** | **2011 ජූලි 21 දිනැති අංක DMS/E1/54/9/241 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව තනතුරු ඇති කිරීම සහ 2011 ජූනි 30 දිනෙන් පසුව අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදු නොකල යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රවේශපත්‍ර අලෙවිකරු/ මුදල් අයකැමි සහ ප්‍රධාන ප්‍රවේශපත්‍ර අලෙවිකරු/ මුදල් අයකැමි තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතියදී පාලක මණ්ඩල අනුමැතිය මත ප්‍රවේශපත් අලෙවිකරුවන් 14 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඉන් සේවයට වාර්තා කර තිබූ ප්‍රවේශපත් අලෙවිකරුවන් 11 දෙනෙකු සඳහා බඳවාගත් දින සිට 2018 නොවැම්බර් දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.3,030,763 ක් ගෙවා තිබුණි. | පිළිතුරු එවා නොමැත | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව බඳවාගැනීම් නොකළ යුතුය. |

## 2.2 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්කෘතික ත්‍රිකෝණයට පරිබාහිරව පිහිටි ගාල්ල, රම්බාවිහාරය, අපේගම, කතරගම, යාපහුව හා බුදුරුවගල යන උරුම ස්ථාන වලට ඇතුල්වන සංචාරකයන්ගෙන් පනතේ විධිවිධානයන්ට පටහැනිව ප්‍රවේශපත්‍ර නිකුත් කර අරමුදල ආදායම් උපයාගෙන තිබුණි. | වර්තමානයට ගැළපෙන පරිදි පනත සංශෝධනය කිරීමට ඉදිරියේදී කටයුතු කල යුතුව ඇත. | පනතේ විධිවිධානයන්ට පටහැනිව සංස්කෘතික ත්‍රිකෝණයට පරිබාහිරව පිහිටි උරුම ස්ථාන සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තු අයකිරීම සඳහා පනත සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

## 2.3 මතභේදයට තුඩුදෙන ගණුදෙණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල පනතේ 4 (ඊ) උප වගන්තිය ප්‍රකාරව අරමුදල සතු මුදල් සඳහා මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කිරීමට සහ එම ආයෝජන ආපසු ලබා ගැනීමට, නැවත ආයෝජනය කිරීමට හා වෙනස් කිරීමට සහ ඒ ආයෝජන වලින් උපචිත වන ආදායම් ලබා ගැනීමට හැකිය. නමුත් අරමුදල විසින් ආයෝජන ආපසු ලබාගැනීමට පෙර මණ්ඩලයේ අභිමතය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2018 වර්ෂය තුළ රු. මිලියන 126.6 ක ආයෝජන නැවත ලබාගෙන තිබුණද ඒ සඳහා 2019 මාර්තු 15 දින ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණි. එසේම පාලක මණ්ඩල අනුමැතිය ලබා නොගෙන 2019 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 2,058.4 ක ආයෝජන ආපසු ලබාගෙන තිබුණි. මෙම ආයෝජන ආපසු ලබා ගැනීම් සඳහා 2019 නොවැම්බර් 15 දින පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගෙන ඇති බවට අදහස් දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් කල එම තොරතුරුවල විශ්වාසනීයභාවය පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.<br>අරමුදල විසින් විධිමත් වියදම් පාලන ක්‍රමවේදයක් අනුගමනය කර | ආයෝජන ගැනීම සෑම වර්ෂයකම සිදු කර ඇත. 2018 වර්ෂයේදී ආපසු ලබා ගත් ආයෝජන සඳහා පාලක මණ්ඩල අනුමැතිය 2019 දී ලබා ගෙනඇත. 2019 සැප්තැම්බර් 30 දින වන විට ආපසු ලබා ගත් ආයෝජන සඳහා පාලක මණ්ඩල සභිකයන් දෙදෙනෙකුගේ පූර්ව අනුමැතිය ලබාගෙන ඇත. තවද පාලක මණ්ඩල සභිකයන් අට දෙනෙකුගේ ආවරණ අනුමැතියද ලබාගෙන ඇත. | පනතේ විධිවිධාන අනුව අරමුදලේ පරමාර්ථ සඳහා පමණක් පාලක මණ්ඩලයේ පූර්ව අභිමතය මත ආයෝජන නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ලබා ගත් මුදල් පාලක මණ්ඩලය අනුමත කළ කාර්යයන් සඳහා පමණක් යෙදවීමට වග බලා ගත යුතුය. |

නොතිබීම නිසා ඉහත පරිදි ලබාගත් මුදල් පාලක මණ්ඩලය විසින් වැය කිරීමට අපේක්ෂා කළ කාර්යයන් සඳහාම යෙදවූ බවට විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

2019 වර්ෂය තුලදී සිදුකර ඇති, එදින වන විට සිදු කරමින් පවතින සහ සිදුකිරීමට නියමිත කාර්යයන් සඳහා අදාල (මුදල් ආයෝජනයට සහ ආයෝජන ආපසු ලබා ගැනීමටද ඇතුළුව) පාලක මණ්ඩල පත්‍රිකා 238 කට අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇති බවට 2019 නොවැම්බර් 15 දින පැවති අංක 209 දරන පාලක මණ්ඩල රැස්වීමට අදාල ලේඛනයක් යැයි සඳහන් කරමින් අමාත්‍යාංශ ලේකම් විසින් අරමුදලේ අධ්‍යක්ෂ (පාලන) වෙත 2019 නොවැම්බර් 20 දින ඉදිරිපත් කර තිබූ එම ලේඛනය අරමුදලේ අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්) විසින් 2020 ජූලි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

එසේ වුවද පනතේ 3(2) වගන්තිය අනුව අරමුදලේ පාලක මණ්ඩල සභිකයන් වන අග්‍රාමාත්‍යවරයා, අග්‍රාමාත්‍ය ලේකම් හා අධ්‍යාපන අමාත්‍යවරයාගේ අත්සන් එම අනුමැතිය සහිත පත්‍රිකාවේ නොතිබීම හේතුවෙන් සහ එම එකිනෙක පාලක මණ්ඩල පත්‍රිකා යම් විමර්ෂන කාර්යයක් සඳහා වෙනත් පාර්ශවයක් ලබාගෙන තිබීම නිසා එම එකිනෙක පත්‍රිකා විගණන පරීක්ෂාවට ලක්කිරීමට නොහැකි වීම හේතුවෙන් එම පාලක මණ්ඩල අනුමැතීන් පිළිබඳව තවදුරටත් විමර්ෂනයට ලක්වීමේ අවශ්‍යතාවය අවධාරනය කෙරේ.

තවද 2019 නොවැම්බර් 15 දින පාලක මණ්ඩල අනුමැතිය ලබාගත් බවට විගණනයට ඉදිරිපත් කළ ලේඛන අනුව, එහි පාලක මණ්ඩල සාමාජිකයින් දොළොස්දෙනාගෙන් අටදෙනෙකුගේ අත්සන් ඇතුලත්ව තිබුණද මණ්ඩලයේ සභාපතිවරයාගේ (අග්‍රාමාත්‍යවරයා) අත්සන ඇතුලත්ව නොතිබුණි. අරමුදල පනතේ 3 (5) උප වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා යම් රැස්වීමකට නොපැමිණි විටෙක පැමිණ

සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලැබූ යම් සාමාජිකයකු එම රැස්වීමේ මූලාසනය ගත යුතු වුවද එදින එවැනි තීරණයක් ගෙන තිබූ බවට අදාල ලේඛනය පරීක්ෂාවේ දී අනාවරණය නොවුණි.

තවද 2019 නොවැම්බර් 15 දිනට පසුව පලමු වරට 2020 පෙබරවාරි 03 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදීද 2019 නොවැම්බර් 15 දිනට අදාල 209 දරන පාලක මණ්ඩල වාර්තාව අනුමත කර නොතිබූ අතර එම පත්‍රිකා විශේෂ විමර්ෂණයකට යොමු කර ඇති බවට සභාපති වරයා විසින් සටහන් කර තිබුණි.

## 2.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් (ආගමික අංශය හැර) පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත. | අරමුදල මඟින් ළඟාකරගැනීමට අපේක්ෂිත ඉලක්ක දක්වා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එය පාලක මණ්ඩලය ලවා අනුමත කර ගැනීමට කටයුතු කිරීම කළමණාකරණයේ වගකීමක් වේ.එබැවින් ඒ පිළිබඳ කළමණාකරණයේ දැඩි අවධානයක් යොමු කළ යුතුය. |
| **(ආ)** | 2018 වර්ෂය සඳහා වූ අරමුදලේ ප්‍රගති සාරාංශය ප්‍රකාරව, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,529 ක් වූ ක්‍රියාකාරකම් 421 ක් 2018 වර්ෂය තුළ ආරම්භ කිරීමට යෝජිතව තිබුණද ඉන් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 189 ක් වූ ක්‍රියාකාරකම් 55 ක් වර්ෂය තුළ ක්‍රියාවට නැංවීමට අරමුදල අපොහොසත් වී තිබුණි.තවද 2019 වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත වටිනාකම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | සැලසුම් සකස් කර අදාල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර ඒ සඳහා මුදල් වෙන් කරවා ගැනීමටත් සැලසුම ප්‍රකාරව අදාල කාර්යයන් ආරම්භ කිරීමටත් ක්‍රියා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 340.8 ක් වූ කැණීම් සංරක්ෂණ ක්‍රියාකාරකම් 53 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | අනුරාධපුර මහා විහාර ව්‍යාපෘතියේ ස්ථාන ගත කර තිබූ දුටුගැමුණු පිළිමය හිරු එළියෙන් හා වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීමේ අරමුණින් 2018 වර්ෂයේ රු.1,393,413ක ඇස්තමේන්තුවක් මත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර තිබුණද ඉදිකිරීමට අපේක්ෂිත ස්ථානය පිළිබඳව චෛත්‍යාරාමාධිකාරී නායක ස්වාමීන් වහන්සේගේ අවසරය නොලැබීම මත මෙම කාර්යය 2020 ජුලි 31 දින වන විටද ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | චෛත්‍යාරාමාධිකාරී ස්වාමීන් වහන්සේගේ අනුමැතිය ලබා නොදීම මත කාර්යය ඉටුකල නොහැකි විය. | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් වලට අදාළ නිසි අනුමැතීන් ඇතුළු මූලික කටයුතු නිමකිරීමෙන් පසු වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| ( ඈ) | 2018 වර්ෂයේ වැඩ සැලැස්මෙහි රු. 1,665,386 ක ඇස්තමේන්තුවක් මත "ශ්‍රී නේරු" අග්‍රාමාත්‍යවරයාගේ සමරු ඵලකය සම්බන්ධ කරමින් අනුරාධපුර මහා විහාර ව්‍යාපෘතියේ ජල පෙරනයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර රු.43,910 ක් වැය කර තිබුණද මෙම කාර්යය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබීම හා පුහුණු ශ්‍රමිකයින් නොමැති වීම හේතුවෙන් එම ඉදිකිරීම අත්හිටුවා තිබුණි. | යෝජිත ස්ථානය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීමත් පුහුණු ශ්‍රමිකයන් නොමැති වීමත් හේතුවෙන් මෙහි ඉදිකිරීම් කටයුතු නැවතී ඇත. | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලට අදාළ නිසි අනුමැතීන් ඇතුළු මූලික කටයුතු නිමකිරීමෙන් පසු වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2018 වැඩ සැලැස්මට ඇතුළත් කර තිබූ අභයගිරිය ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුගත වටිනාකම රු.9,484,667 ක් වූ නේවාසිකාගාරයේ වැසිකිළි අළුත්වැඩියාව හා රථගාල් 02ක් ඉදිකිරීම 2020 ජුලි 31 වන දින විටත් සිදු කෙරෙමින් පැවති අතර කෞතුකාගාරයේ වැසිකිළි ඉදිකිරීම් කාර්යය අත්හැර දැමීම නිසා ව්‍යාපෘතිය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට සැපයීමට සැලසුම් කල සනීපාරක්ෂක ,වාහන ගාල් කිරීමේ පහසුකම් හා නේවාසිකාගාර සිසුන්ගේ සනීපාරක්ෂක පහසුකම් සැලසීමට නොහැකි වී තිබුණි. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේඅනුමැතිය නොලැබීම මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලට අදාළ මූලික කටයුතු නිමකිරීමෙන් පසු හා ව්‍යාපෘතියක් බාධාවකින් තොරව කරගෙන යා හැකි බව සනාථ කර ගැනීමෙන් පසුව පමණක් අදාල ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සීගිරිය කෞතුකාගාර ගොඩනැගිල්ලේ වහළයෙන් වර්ෂා ජලය කාන්දුවීම වළක්වාගැනීම සඳහා අවශ්‍ය අළුත්වැඩියාවන් රු. 2,410,375 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2018 වර්ෂයේදී නිමකිරීම සඳහා සැලසුම් කර තිබුණද එම කාර්යය ඉටුකිරීමේ ක්‍රමවේදය පිළිබඳ අවසන් එකඟතාවයකට එළඹීමට නොහැකිවීම හේතුවෙන් එකී කාර්යය ඉටුකර නොතිබුණි.නිළධාරීන්ගේ අවශ්‍යතා මත විධිමත් ඇස්තමේන්තුවක් හා ඉටුකල යුතු කාර්යයන් හඳුනා නොගැනීම නිසා මෙම තත්ත්වය ඇතිවී තිබුණි.වැසිජලය කාන්දුවීම නිසා ගොඩනැගිල්ලේ පෙනුම අවපැහැගැන්වී තිබීම මත ස්ථානයට පවතින සංචාරක ආකර්ෂණය අඩුවීමටද හැකි බව නිරීක්ෂණය විය. | විශේෂඥ උපදෙස් අවශ්‍ය වූ බැවින් ඒ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයෙන් උපදෙස් ලැබෙන තෙක් තාවකාලිකව එම කාර්යය නතර කරන ලදී. | ඉදිරිපත් කර ඇති අදහස් දැක්වීමට අනුව විධිමත් අධ්‍යනයක් සිදු නොකර ඇස්තමේන්තුව පමණක් සකස් කර ඇතිබව නිරීක්ෂණය වේ.මෙම තත්ත්වය අරමුදලේ කාර්යයන් කරගෙන යෑමට බාධාවක් වන බැවින් මේ පිළබඳ කළමණාකරනයේ දැඩි අවධානය යොමුකල යුතුය. |
| (උ) | සීගිරිය ව්‍යාපෘතියේ සී.සී.ටී.වී. කැමරා පද්ධතියක් සවිකිරීම සඳහා රු. 9,560,000 ක ඇස්තමේන්තුවක් යටතේ 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව එම කාර්යය ඉටුකර නොතිබුණි. මෙම නිසා ප්‍රවේශපත්‍ර නිකුත්කිරීමේදී සිදුවිය හැකි අක්‍රමිකතා වැළැක්වීම, පුරාවස්තු, කෞතුකාගාර භාණ්ඩ හා සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි. | කැමරා පද්ධතිය සවිකිරීම පිළිබඳව විටින් විට සිදුකල ප්‍රතිපත්තිමය තීරණ වල වෙනස්කම් හේතුවෙන් ආරම්භ කිරීමට නොහැකි විය. | ප්‍රවේශපත්‍ර නිකුත්කිරීමේ කාර්යයන්, පුරාවස්තු, කෞතුකාගාර භාණ්ඩ හා සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට මෙවැනි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළමණාකරණයේ අවධානය කඩිනමින් යොමු කළ යුතුය. |
| (ඌ) | අප්සරා සම්පත් මධ්‍යස්ථානයෙහි ඉදිරිපස භූමිය සැකසීම සඳහා රු.4,975,865 ක ඇස්තමේන්තුවක් මත 2018 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර රු.2,694,130 ක් වැයකර තිබුණද 2020 ජූලි 31 දින වන විටද සැලසුම් කල පරිදි භූමිය සැකසීම සිදු නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිලි සංචාරකයින්ගේ පරිහරණය වෙනුවෙන් විවෘත කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි. | භූදර්ශන කටයුතු සඳහා සැකසූ ඇස්තමේන්තුව දෙවරක් සංශෝධනය වූ බැවින් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. | වැඩ සැලැස්මෙහි වාර්ෂික ඉලක්කයන් කරා අපේක්ෂිත පරිදි වර්ෂය තුළ ළඟාවිය යුතුය. |
| (එ) | රු. 6,572,500 ක ඇස්මේන්තුවක් මත ථූපාරාම වටදාගෙයෙහි අවශේෂ වී විසිරී පවතින කුළුණු කොටස් නැවත සලපතළ මළුවේ එම කුළුණු ස්ථාපිත | කුළුණු හඳුනා ගැනීමේදී කුළුණු වල වැඩි කොටස් ප්‍රමාණයක් නොමැති වීම නිසා එම කාර්යය ඉටු කිරීමට නොහැකි බව | තාක්ෂණික උපදෙස් මත ක්‍රියාත්මක විය යුතු ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික වාර්තා ලබා |

| | | | |
|---|---|---|---|
| | කිරීම අරමුණු කර තිබුණද හමුවී ඇති කිසිදු කුළුණක සම්පූර්ණ කොටස් හමු නොවීමත් කුළුණුවල ශක්තිය හීනවී ඇති බවත් තීරණය කිරීම නිසා මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කිරීම ගැටලු සහගත බැවින් 2020 ජුලි 31 දින වන විට අදාල කාර්යය ඉටුකිරීම අත්හැර දමා තිබුණි. | නිගමනය වූ අතර 2019 වර්ෂයේදී ථූපාරාම සංරක්ෂණ කාර්යයේදී පළමු කී කුළුණු කොටස් විධිමත්ව පහල මළුවේ තැම්පත් කිරීමට යෝජනා වූයෙන් මේ වන විට කුළුණු කොටස් තැන්පත් කර ඇත. | ගැනීමෙන් පසු ක්‍රියාකාරකම් සැලසුම් කර වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඒ)** | 2018 වැඩ සැලැස්මට ඇතුළත්ව තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.4,780,000 ක් වු ආළාහණ පරිවෙන කෞතුකාගාරයේ වහලය අළුත්වැඩියා කිරීමේ කාර්යයට අදාල ලංසු විවෘත කිරීම 2018 ජුලි මස 16 දින සිදු වුවද අදාල ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් සමාගම වෙත ප්‍රදානය කිරීමට මාස 06 කට ආසන්න කාලයක් ගත කර 2019 පෙබරවාරි 02 දින සිදු කර තිබීම හේතුවෙන් මෙම කාර්යය 2020 ජුලි 31 දින වන විටත් මන්දගාමීව සිදු කෙරෙමින් පැවතුණි. | පිළිතුරු එවා නොමැත | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලට අදාළ මූලික කටයුතු නිමකිරීමෙන් පසු වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඔ)** | 2017 වර්ෂයේ ආරම්භ කර නිම නොකළ, 2019 වැඩ සැලැස්මටද ඇතුළත්ව තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.6,704,800 ක් වු පොළොන්නරු පූජාභූමියේ විදුලි ආලෝකකරණය කිරීමේ ව්‍යාපෘතියේ ගල්විහාර වංගුවේ සිට පිටවීමේ දොරටුව දක්වා සුදුසු වර්ගයේ ලෝහමය පහන් කණු 170ක් සවිකිරීම පිළිබඳව තීරණය කිරීමේදී අරමුදල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා වෙනත් පාර්ශවයන් සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකි වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මන්දගාමීව සිදුවෙමින් පැවතුණි. | පිළිතුරු එවා නොමැත | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලට අදාළ මූලික කටයුතු නිමකිරීමෙන් පසු වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඕ)** | අරමුදලේ 2018 හා 2019 වර්ෂ වල වැඩ සැලැස්මේ ඇතුලත් කොළඹ හබරණ මහාමාර්ගයට සමාන්තරව පොළොන්නරුව පූජාභූමියේ යකඩ වැට ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2019 ඔක්තෝබර් 25 දින වන විට කොන්ත්‍රාත් සමාගම විසින් මෙම වැටෙහි මීටර් 212 ක් පමණක් වැඩ සම්පූර්ණයෙන් අවසන් කර තිබූ අතර ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් තවත් | පිළිතුරු එවා නොමැත | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලට අදාළ මූලික කටයුතු නිමකිරීමෙන් පසු වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මීටර් 600 ක් ඉදිකිරීම් කටයුතු සිදුකල යුතුව තිබූ අතර 2020 ජුලි 31 දින වන විටද මෙම කාර්යය සිදු කෙරෙමින් පැවතුණි. | | |
| **(ක)** | 2018 වැඩ සැලැස්මෙහි ඇතුළත් පොළොන්නරුව තිවංක පිළිමගෙය දක්වා දිවෙන පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුවේ සඳහන් රු. 61,089,451 ක ප්‍රතිපාදන පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දීම සඳහාවූ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාදීමට 2019 අගෝස්තු 30 දින දක්වා කල්ගත වීම නිසා තිවංක පිළිමගෙය දක්වා දිවෙන කිලෝමීටර් 1.5 ක දුරකින් යුත් පිවිසුම් මාර්ගයේ ඉදිකිරීම් කාර්යයන් 2020 ජුලි 31 දින වන විට ද අවසන් වී නොතිබුණු අතර ඒ හේතුවෙන් සංචාරකයන්ගේ ගමනාගමන කටයුතු සඳහා මාර්ගය ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. | පිළිතුරු එවා නොමැත | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලට අදාළ මූලික කටයුතු නිමකිරීමෙන් පසු වැඩ සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ග)** | 2017 වර්ෂයේ ආරම්භ කළ සසුනෝදය වැඩසටහන යටතේ සංස්කෘතික හා ආගමික ස්ථාන 84ක අළුත්වැඩියා කටයුතු සඳහා 2018 වර්ෂය තුළ රු. මිලියන 28.6 ක් පරිත්‍යාග කර තිබුණි. පරිත්‍යාග ලබාදුන් ආගමික ස්ථාන 60 ක් එනම් සියයට 71.4 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන වූ අතර සියයට 29.6 ක් පුත්තලම, රත්නපුර හා මහනුවර දිස්ත්‍රික්ක සඳහා පරිත්‍යාග කර තිබුණි. මේ අනුව පරිත්‍යාග ලබා දීමේදී සමස්ත දිවයිනම ආවරණය වන පරිදි විධිමත් ක්‍රමවේදයක් මතපරිත්‍යාග ලබාදීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය කෙරේ. | මූලික වශයෙන් පිළිගනිමි. | අරමුදල විසින් පරිත්‍යාග ලබා දීමේදී සාධාරණ පදනමක් මත සමස්ත දිවයිනම ආවරණය වන පරිදි පරිත්‍යාග බෙදී යන පරිදි විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතුය. |

## 2.5 කළමනාකරණ ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ රියදුරන් සඳහා අතිකාල වෙනුවෙන් 2018 වර්ෂයේ දරන ලද වියදම රු. 2,249,248 ක් වූ අතර ගෙවන ලද අතිකාල පැය ගණන විශ්ලේෂණයේදී දෛනික සාමාන්‍ය රාජකාරි කාලය වූ පැය 9 ට අමතරව අතිකාල පැය 8 ක් හෝ ඊට වැඩි පැය ගණනක් රාජකාරියෙහි යෙදී තිබුණි. | පිළිතුරු එවා නොමැත | අතිකාල රාජකාරියේ යෙදීමේ අවශ්‍යතාවයන් පිළිබඳ මාසිකව සමාලෝචනය කරමින් අතිකාල රාජකාරි කටයුතු හැකිතාක් අවම කිරීමටත් අතිකාල පාලනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පාලක මණ්ඩලය වෙත පැවරී තිබුණද 2018 හා 2019 වර්ෂ තුළ කාලීනව පාලක මණ්ඩලය රැස්වී නොතිබුණි. | පිළිගනිමි | අරමුදලෙහි අරමුණු ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීම සඳහා පාලක මණ්ඩලය කාලීනව රැස්වී කළමනාකරණ තීරණ නිසි පරිදි ගෙන ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 1999 වර්ෂයේදී අභයගිරි ව්‍යාපෘතියට රු. 392,400 කට මිලදී ගත් ගඩොල් පරීක්ෂා කිරීමේ යන්ත්‍රයේ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලකින් තොරව වරින්වර යන්ත්‍රය ස්ථානගත කිරීම නිසා යන්ත්‍රය මේ වනවිට අක්‍රීය වී තිබුණි. මේ හේතුවෙන් බාහිර ආයතන වලින් ගඩොල් පරීක්ෂා කිරීමට අමතර වියදමක් දරා තිබුණු අතර යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලද මෙම යන්ත්‍රය ඇතුලත් කර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | ආයතනයේ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ඈ) | ආළාහණ පරිවෙන ආපනශාලව සංචාරකයන්ට පැහැදිලිව පෙනෙන තැනක ස්ථානගත නොකිරීම හේතුවෙන් අරමුදල විසින් රු. 6,268,387 ක වියදමින් ඉදිකරන ලද ආපනශාලාව 2019 ඔක්තෝබර් 25 දින වන විටත් දෙස් විදෙස් සංචාරකයින්ගේ ආහාරපාන අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගත නොහැකිව වසාදමා තිබුණි. | පිළිතුරු එවා නොමැත | වත්කම් සඳහා වියදම් දැරීමේදී එහි ඵලදායීතාවය පිළිබඳ වගකිව යුතු නිළධාරීන්ගේ අවධානය යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අධ්‍යාපන අමාත්‍යාංශයයේ අධීක්ෂණය යටතේ පැවැති “අපේ ගම” ආයතනයේ අධීක්ෂණ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරීම සඳහා දෙපාර්ශවය විසින් 2016 ජූනි 16 දිනැති අංක ඊඩී/10 එන්එච්/ 03/02/01/07 දරන අවබෝධතා ගිවිසුමට එළඹ තිබුණි. එම ගිවිසුමට අනුව “අපේ ගම” ආයතනයේ සියලු ගොඩනැගිලි සහ භාණ්ඩ විධිමත් පරිදි භාරගැනීමට 2020 ජූනි වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | “අපේ ගම” ආයතනයේ සියලු ගොඩනැගිලි සහ භාණ්ඩ විධිමත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් භාරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අන්තර්ජාලය මඟින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් අරමුදල විසින් සිදුකර නොතිබීම නිසා සීගිරිය ව්‍යාපෘතිය පමණක් අන්තර්ජාලය මඟින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සිදු කරන අතර මෙම හේතුව නිසා අනෙකුත් ව්‍යාපෘතිවල විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමට 2020 ජූනි වන විටද අපොහොසත් වී තිබුණි. | ICTA ආයතනයේ මෘදුකාංග සකස් කිරීමේදී සිදු කරන ලද අඩුපාඩු කිහිපයක් හේතුවෙන් ගැටලු ඇතිවී ඇත. ඉදිරියේදී අනෙකුත් ව්‍යාපෘති සඳහා වැඩසටහන ව්‍යාප්ත කිරීමට හැකි වනු ඇත. | යම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘතියේ අරමුණු , කාර්යයන් ,ඊට අදාළ කාල රාමුව, වගකිව යුතු පාර්ශවයන් , මානව හා භෞතික සම්පත්වල අවශ්‍යතාවය හා දැරීමට සිදු වන පිරිවැය පිළිබඳ නිසි පරිදි හඳුනා ගැනීම සඳහා ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතු බව හා සියළුම අංශ ආවරණය වන පරිදි පද්ධතිය ක්‍රියාත්මක කල යුතුය. |
| (උ) | 2010 නොවැම්බර් 20 දිනැති අංක 447 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහිත කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට අරමුදල විසින් 2020 ජූනි වන විටත් කටයුතු කර නොතිබුණි. | යෝජිත බඳවා ගැනීමේ පටිපටියට මෙම තනතුරුද ඇතුලත් කර බඳවාගැනීමට කටයුතු කරනු ඇත. | අන්තර්ජාලය හරහා විද්‍යුත් ප්‍රවේශපත් නිකුත් කිරීමේ පද්ධතියක් නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහිත කාර්ය මණ්ඩලයක් අරමුදලේ සේවයේ යෙදවිය යුතුය. |
| (ඌ) | 2011 පෙබරවාරි 10 දිනැති අංක අමප/11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අරමුදලේ ආදායමෙන් සියයට 25 ක් පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට ලබාදිය යුතු වුවද 2018 හා 2019 වර්ෂවල උපයා තිබුණු ප්‍රවේශපත්‍ර ආදායමෙන් රු. මිලියන 1,896.1 ක මුදලක් අමාත්‍යාංශය වෙත ලබාදිය යුතු වුවද රු. මිලියන 1,151 ක් පමණක් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති සඳහා සත්‍යවශයෙන් වැය වන මුදල් පමණක් ලබාදීමට උපදෙස් දී ඇත. 2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරය නිසා ආදායම් අඩු වූ බැවින් සියයට 25 ලබා දීම ගැටලු සහගත වී ඇත. | 2011 පෙබරවාරි 10 දිනැති අංක අමප/11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අරමුදල විසින් උපයා ගනු ලබන ආදායමින් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් අමාත්‍යාංශයට ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(එ)** | ආගමික ස්ථානවල උත්සව පෙරහැර මංගල්‍ය සඳහා අරමුදල පනත ප්‍රකාරව ආධාර මුදල් ලබා දිය හැකි වුවද ඒ සඳහා කිසිදු විධිමත් ක්‍රමවේදයක් අරමුදල විසින් හඳුන්වා දී නොතිබුණි. මෙම හේතුව නිසා කිසිදු පදනමක් හෝ මූල්‍ය අවශ්‍යතාවය පිළිබඳ ඇස්තමේන්තුවක් හෝ නොමැතිව,ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලියා තිබූ චෙක්පත් රේඛීය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ සේවකයින් වෙත ඉහත කටයුතු සඳහා අවස්ථා 13කදී ලබා දී තිබූ අතර එහි වටිනාකම රු. 4,250,000 ක් විය. | පෙරහැර මංගල්‍ය සඳහා සහ ආදාහන උත්සව සඳහා අමාත්‍ය කාර්යාලයට ඉල්ලීම් ලිපි ඉදිරිපත් කිරීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීම මේ දක්වා සිදු වී ඇති ක්‍රමවේදය වේ. | මෙම කාර්යය අරමුදල විසින් එහි බලතල ප්‍රකාරව ලබා දෙන ආධාර මුදලක් බැවින් එවැනි ආධාර ලබා දීම් අරමුදල මඟින් ලබා දීමට කටයුතු කල යුතුය.මෙම ආධාර ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සම්පාදනය කරගැනීමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |
| **(ඒ)** | අරමුදලේ ප්‍රධාන කාර්යාලය අලුත්වැඩියා කටයුතු සිදුකරන තෙක් අරමුදලේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා අරමුදල විසින් 2017 වර්ෂයේදී සෙත්සිරිපාය II වන අදියරෙහි 4 වන මහලෙහි “ඩී” පර්යන්තය කුලී පදනම මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර තෝරාගෙන තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ හා 2019 සැප්තැම්බර් 30 දින දක්වා ගොඩනැගිලි කුලිය, සනීපාරක්ෂක කටයුතු සඳහා ගාස්තු සහ විදුලි ගාස්තු ලෙස පිළිවෙලින් රු. 17,311,809 ක්, රු. 13,067,655 ක් අරමුදල විසින් ගෙවා තිබූ අතර 2020 ජූලි වනවිටත් වනවිටත් ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි. | එකඟ වෙමි. භූමියේ අයිතිය අරමුදල සතු නොවන බැවින් අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර අවම පිරිවැයක් හා ගුණාත්මක තත්ත්වයකින් යුතුව විකල්ප අවස්ථා ඇගයීම තුලින් ප්‍රසස්ථතම විසඳුම තෝරා ගැනීමට කටයුතු කළ යුතු අතර භූමියේ අයිතිය නිරවුල් කර ගැනීමට හෝ පැවරුම් බල පත්‍රයක් ලබා ගැනිමට කටයුතු කල යුතුය. |
| **(ඔ)** | මුලු දිවයිනම ආවරණය වන ලෙස හා සර්ව ආගම් නියෝජනය වන පරිදි එක් ගොඩනැගිල්ලක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3ක් (VAT හා පරිපාලන වියදම් රහිත) වූ දහම් පාසල් ගොඩනැගිලි 332 ක් ඉදිකර පරිත්‍යාග කිරීමට 2019 වර්ෂය තුලදී **“සිසු දහම් සෙවන”** නමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. 2019 මාර්තු 15 දින ලබා දුන් පාලක මණ්ඩල අනුමැතිය මත එකම ගොඩනැගිලි සැලැස්මකට අනුව දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම්කර තිබූ අතර 2019 වර්ෂයේ | | |

| | | | |
|---|---|---|---|
| | අයවැය ලේඛනය අනුව එම වැඩසටහනෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,140 ක් විය.ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කල ඇස්තමේන්තුමේන්තුව රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණි.එක් එක් අදියරයන් යටතේ අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණු අතර එම ගිවිසුම්වල බිල්පත් පරීක්ෂාවක් සිදු නොකිරීම,ඇප/සුරක්ෂණ ලබා ගැනීමේ අවශ්‍යතාවක් නොවන බව, නියමිත කාලය තුල ඉදිකිරීම් අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ගෙවීම් අඩුකිරීමකින් තොරව ඉදිකිරීම් කාලය දීර්ඝ කිරීම ආදී කොන්දේසි ඇතුළත් කර තිබුණි. | | |
| **(i)** | මෙම ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලින් පමණක් ඉදිකරගැනීමට පාලක මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණද මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ප්‍රකාරව අමාත්‍යමණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව අදාළ කාර්යය සඳහා අමාත්‍යමණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| **(ii)** | අදියර 3 ක් යටතේ ඉහත ඇස්තමේන්තු ප්‍රකාරව දහම් පාසල් ගොඩනැගිලි 298 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2019 ඔක්තෝබර් 30 දින වනවිට රු. මිලියන 753.5 ක් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 03 ක් වෙත එනම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.මිලියන 121.5 ක්, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත රු.මිලියන 353.3 ක් සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු.මිලියන 278.7 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. | පිළිතුරු එවා නොමැත. | සංවර්ධන ව්‍යාපෘතියක් ඇරඹීමට පෙර අදාළ අධිකාරී බලය ලබාගැනීම, ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම කළමණාකරණයේ වගකීම වේ. |
| **(iii)** | ඉහත ඉදිකිරීම් කටයුතු භාරදුන් ගොඩනැගිලි 298 කින් ගොඩනැගිලි 45 ක් පමණක් නිමකර 2019 මැයි 30 දිනට අරමුදලට භාරදී තිබූ නමුත් උපරිම වශයෙන් 2019 ඔක්තෝබර් | පිළිතුරු එවා නොමැත | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම කළමණාකරණයේ වගකීම වන අතර ඉදිකිරීම් ආයතන බැඳීමට යටත් වන පරිදි ගිවිසුම්වලට එළඹීමද |

| | | | |
|---|---|---|---|
| | 30 දින විට භාරදිය යුතුව තිබුණු ඉතිරි ගොඩනැගිලි 253 ක සඳහා ඇස්තමේන්තු වටිනාකමින් සියයට 29.2 සිට සියයට 94.6 ක් දක්වා ගෙවීම් කර තිබුණද ඉදිකිරීම් නිමකර අරමුදල වෙත ආපසු භාරගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.භාරදුන් ගොඩනැගිලිවලින් ඇතැම් ගොඩනැගිලි නියමිත ප්‍රමිතියට අනුව නිමකර නොතිබුණද ඉදිකිරීම්වලට අදාළ අවබෝධතා ගිවිසුම්වල අඩුපාඩු හේතුවෙන් ඒ පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. | | කළ වැඩ සඳහා වගකිව යුතු නිළධාරියකුගේ සහතිකයක් ලබා ගැනීමටද ක්‍රියා කළ යුතුය. |
| **(iv)** | දහම් පාසල් තෝරාගන්නා ආකාරය පිළිබඳ නිර්නායක හා දහම් පාසල් ප්‍රමාණය තීරණය කිරීමේදී යොදාගනු ලබන ක්‍රමවේදය පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත. | අරමුදල පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(v)** | ගොඩනැගිලි ඉදිකිරීම් නිමකර භාරදී නොතිබීම. ඇතැම් ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබීම, ඇතැම් ගොඩනැගිලි කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම, ප්‍රතිලාභීන් විසින් අරමුදලින් ඉල්ලීමක් කර නොතිබියදී ගොඩනැගිලි ඉදිකර දීම, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් එවන ලද ඉල්ලීම් ලිපි ලැයිස්තුවලට බාහිරව ගොඩනැගිලි ඉදිකර දීම වැනි හේතුමත අරමුදල විසින් නිසි අධ්‍යයනයකින් තොරව හා නිසි අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයකින් තොරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී ඇති බව නිරීක්ෂණය වේ. | පිළිතුරු එවා නොමැත | අවශ්‍යතාව පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අරමුදලේ මුදල් ඵලදායීව කළමණාකරනය නොකිරීම පිළිබඳව අදාල නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම. |
| **(ඕ)** | ආළාහන පරිවෙන ව්‍යාපෘතියේ කෞතුකාගාරය අසළ වැසිකිළි පද්ධතිය 2016 ජනවාරි 16 දින ඉදිකිරීම ආරම්භ කර තිබුණද 2019 ඔක්තෝබර් 25 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී ඇතුළත හා පිටත නිම කලයුතු කාර්යයන්ගෙන් සියයට 85ක පමණ වැඩ නිම වී තිබුණද වැසිකිළි උපාංග සවිකිරීම,ජල හා විදුලි සම්බන්ධතා ලබාදී නොතිබු බැවින් සහ ඉදිකිරීම් කටයුතු නවතා | පිළිතුරු එවා නොමැත. | අරමුණු ඉටුකර ගැනීම කළමණාකරණයේ වගකීම වේ. |

| | | | |
|---|---|---|---|
| | දමා තිබීම හේතුවෙන් වැය කරන ලද රු.7,262,168 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.2020 ජුලි 31 දින වන විටද මෙම කාර්යය ඉටුකර නොතිබුණි. | | |
| **(ක)** | විදේශ සංචාරකයන් සඳහා ප්‍රවේශපත්‍ර මුද්‍රණය කිරීමේදී ප්‍රවේශපත්‍ර වංචනිකව සංසරණය වීම වැළැක්වීම සඳහා අවම වශයෙන් භාවිතා කල යුතු ආරක්ෂිත ක්‍රමවේදයක් එනම් ආරක්ෂිත කඩදාසි භාවිතය,දිය සලකුණු හෝ ආරක්ෂිත මුද්‍රාවක් යෙදීම, ආරක්ෂිතව අංකනය කිරීම, සිදුරණය කිරීම(perforation) හා පිළිපත් සහිතව මුද්‍රණය කිරීම මත ආරක්ෂිත ක්‍රම අනුගමනය කර ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | වංචා සිදුවීමට ඇති අවධානම සහිත මුදල් හා සමාන වටිනාකමක් ඇති ප්‍රවේශපත්‍ර මුද්‍රණ ක්‍රියාවලිය සම්බන්ධව ඉතා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කල යුතුය. |
| **(ග)** | සීගිරිය ව්‍යාපෘතියට අයත් ආපනශාලාවෙන් 2019 මාර්තු 15 දින සිට 2019 අගෝස්තු 14 දක්වා රු.652,500 ක් හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.සීගිරිය ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ජල මීටරය මඟින් ආපනශාලාව සඳහාද ජලය ලබාගෙන ඇති අතර ඒ සඳහා වෙනම ජලමීටරයක් සවිකර නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | අරමුදලට ලැබිය යුතු හිඟ බදු ආදායම් ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු බව හා ආපන ශාලාව සඳහා වෙනම ජල මීටරයක් සවි කල යුතුය. |

**2.6** **මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2018 දෙසැම්බර් මස මුදල් පොතට අනුව අවලංගු කරන ලද රු.22,151,181 ක චෙක්පත්වලට අදාළව මුදල් රෙගුලාසි 392 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අඩුපාඩු අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත | අවලංගු කරන චෙක්පත් වලට අදාලව මුදල් රෙගුලාසි 392 (ඇ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ආ)** | තැපෑලෙන් යවනු ලබන සියලුම චෙක්පත් පිළිබඳව මුදල් රෙගුලාසි 388(1) ප්‍රකාරව විස්තර අඩංගු ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. | තැපෑලෙන් යවනු ලබන සියලුම චෙක්පත් පිළිබඳව මුදල් රෙගුලාසි 388(1) ප්‍රකාරව විස්තර අඩංගු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත. | තැපෑලෙන් යවනු ලබන සියලුම චෙක්පත් පිළිබඳව යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව විස්තර අඩංගු ලේඛනයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | 2018 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව රු.91,402 ක් වූ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ආ), (ඇ), (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි**.** | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ආ), (ඇ), (ඈ) ප්‍රකාරව අරමුදල විසින් කටයුතු කල යුතුය. |
| **(ඈ)** | අරමුදලේ ප්‍රධාන කාර්යාලය විසින්, ව්‍යාපෘති වියදම් ප්‍රතිපූර්ණය කිරීමේදී චෙක්පත් භාවිතා කර නොතිබුණු අතර ඒ සඳහා අරමුදලේ ගණකාධිකාරී, සහකාර ගණකාධිකාරී, අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත් සංවර්ධන), ගිණුම් නිලධාරී යන නිලධාරීන්ගේ අත්සනින් යුතු ලිපි මගින් බැංකුව වෙත නියෝග ලබාදී තිබුණ අතර 2018 දෙසැම්බර් මාසය තුළ පමණක් රු.119,565,582 ක මුදල් මාරු කර තිබුණි. කෙසේ වුවද චෙක්පත් රහිතව නියෝග මගින් එවැනි ගෙවීම් කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | චෙක්පත් රහිතව නියෝග ලබාදීමක් මගින් ගෙවීම් කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු අතර ඒ පිළිබඳ ශක්තිමත් අභ්‍යන්තර පාලන පිළිවෙත් අනුගමනය කර ක්‍රියාත්මක කළ යුතුය. |

**2.7** **බාහිර පාර්ශව වෙත මුදාහල වත්කම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | තිස්සමහාරාම ව්‍යාපෘතිය සතු ගඩොල් පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2015 අප්‍රේල් තාවකාලික පදනම මත අනුරාධපුර යුධ හමුදා කඳවුර වෙත රැගෙන ගොස් තිබුණු අතර 2019 ජනවාරි වන විටත් ආපසු ලබාගෙන නොතිබුණි | පිළිතුරු එවා නොමැත | බාහිර පාර්ශව වෙත මුදාහල වත්කම් ආපසු ලබාගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | 2011 වර්ෂයේදී දෙබරවැව දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතියට රැළි තහඩු 19 ක් හා ටෙන්ට් රෙදි 01 ක් ලබාදී තිබුණද 2019 ජනවාරි 07 දින වනවිටත් ආපසු ලබාගෙන නොතිබුණි | පිළිතුරු එවා නොමැත | බාහිර පාර්ශව වෙත මුදාහල වත්කම් ආපසු ලබාගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | සඳහිරු සෑය ඉදිකිරීම් කටයුතු සඳහා GI බට 1455 ක් හා කප්ලින් 2,150 ක්ද, පොතුවිල් මුහුදු විහාරයට GI බට 1000 ක් හා කප්ලින් 1000 ක්ද, ශ්‍රී මහා බෝධි යෝගාශ්‍රමයට GI බට 250 ක් හා කෆ්ලින්ක්ස් 500 ක්ද ලබාදී තිබුණු අතර 2019 ජනවාරි 07 දින වනවිටත් ආපසු ලබාගෙන නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | බාහිර පාර්ශව වෙත මුදාහල වත්කම් ආපසු ලබාගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

## 2.8 කාර්ය මණ්ඩල කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා ව්‍යාපෘති අතර මනා සම්බන්ධීකරණයක් සහ නිසි අධීක්ෂණයක් නොමැති බව, ව්‍යාපෘති කාර්යාලවල නිවාඩු,හිලව් නිවාඩු,කෙටි නිවාඩු පරීක්ෂා කිරීම,වැටුප් ගණන් බැලීම,රාජකාරියට පැමිණීමේ හා පිටවීමේ වේලාවන්, ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාවිරහිත වූ පසුව දෝෂ නිවැරදි කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීමේදී අරමුදල විසින් අනුගමනය කරන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී තහවුරු විය. | පිළිතුරු එවා නොමැත | කාර්ය මණ්ඩල පරිපාලනයේදී අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා ව්‍යාපෘති අතර මනා සම්බන්ධීකරණයක් සහ නිසි අධීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ආ) | 2011 ජූලි 21 දිනැති අංක DMS/E1/54/9/241 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ 04 ඡේදය ප්‍රකාරව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට නව තනතුරු ඇති කිරීම සිදු නොකල යුතු වුවත් 2017 අගෝස්තු 08 දිනැති පාලක මණ්ඩල අනුමැතිය මත පළාත් සහකාර අධ්‍යක්ෂවරු 05 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර පාලක මණ්ඩල අනුමැතිය මත මසකට රු.45,930 ක් බැගින් වැටුප් ගෙවා තිබුණි. | පිළිතුරු එවා නොමැත | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව තනතුරු ඇති කිරීම සිදු නොකල යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දින වනවිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 න් තනතුරු 14 ක්ද (අධ්‍යක්ෂ ජනරාල් තනතුරද ඇතුළුව) තෘතියික මට්ටමේ තනතුරු 46 න් තනතුරු 12 ක්ද ද්විතියික මට්ටමේ තනතුරු 478 න් 64 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 2468 න් තනතුරු 451 ක්ද වශයෙන් තනතුරු 541 ක් පුරප්පාඩු වී පැවති අතර තෘතියික මට්ටමේ තනතුරු 2ක්ද ද්විතියික මට්ටමේ තනතුරු 97 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 40 ක්ද වෙනත් තනතුරු 45 ක්ද වශයෙන් | 2018 දෙසැම්බර් 31 දිනට තත්වය සඳහා එකඟ වෙමි . | ආයතනය කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමටත් අනවශ්‍ය ලෙස කාර්ය මණ්ඩල බඳවා ගැනීමෙන් වැළකීමටත් කටයුතු කළ යුතුය. 2019 දෙසැම්බර් 31 දිනට තත්වය සඳහා අදහස් දක්වා නොමැත |

| | | | |
|---|---|---|---|
| | තනතුරු 184 ක් අතිරික්ත වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්යය මණ්ඩලය 3008 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක් තෘතීයික මට්ටමේ තනතුරු 20 ක් ද්විතියික මට්ටමේ තනතුරු 136 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 498 ක් වශයෙන් තනතුරු 665 ක් එදිනට පුරප්පාඩුව පැවතුණි. | | |
| **(ඇ)** | තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා ක්‍රමවත් පරිපාටියක් අනුගමනය කර නොතිබුණි. 2018 වර්ෂයේදී අනුමත තනතුරු 87 ක් සඳහා සාධාරණ හේතුවක් නොදක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත 139 ක් බඳවාගෙන තිබුණි. එසේම බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති තනතුරු 45 ක් සඳහාද බඳවා ගෙන තිබුණි. | එකඟ වෙමි | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව බඳවා ගැනීමෙන් වැළකීමට කටයුතු කළ යුතුය. |
| | 2019 දෙසැම්බර් 31 දින වනවිට අනුමත තනතුරු සඳහා අනුමත සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් /වැඩ බැලීමේ/රාජකාරී ඉටු කිරීමේ පදනම මත අනුමත තනතුරු 05 ක් සඳහා 104 දෙනෙකු ද අනුමත තනතුරු සඳහා බඳවාගැනීම ස්ථිර පදනම මත කළ යුතු වුවද අනුමත තනතුරු 16 ක් සඳහා අනියම්/කොන්ත්‍රාත් /වැඩ බැලීමේ/රාජකාරී ඉටු කිරීමේ පදනම මත 123 දෙනෙකුද අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව තනතුරු(අනුමත නොවූ තනතුරු) 07 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත, දිස්ත්‍රික් පදනම හා පුහුණු ලෙස 1492 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පිළිතුරු එවා නොමැත | |
| **(ඉ)** | අරමුදලේ අනුමත තනතුරක් නොවන අධ්‍යක්ෂ (ආගමික) තනතුර සඳහා 2017 ජුනි 21 දින සිට 2018 මැයි 31 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියකු සඳහා රු.1,060,521 ක් වැටුප් ගෙවා තිබුණි. | එකඟ වෙමි.දැනට සේවයේ නොමැත | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව බඳවා ගැනීමෙන් වැළකීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා නව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කිරීම සඳහා 2017 අගෝස්තු 08 පැවති අරමුදලේ පාලක මණ්ඩල රැස්වීම් 203 දී අනුමැතිය ලබාගෙන එම කාර්යය ඉටුකිරීම සඳහා 2017 ජූනි මාසයේදී කමිටුවකට භාර දී තිබුණද 2020 ජූලි මාසය දක්වාම එම කටයුතු අවසන් වී නොතිබුණි. | පිළිතුරු එවා නොමැත | නව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට හා බඳවාගැනීම ක්‍රමවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් වෙනුවෙන් සේවකයින් බඳවා ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) 2,271 සහ මුර කරුවන් 1,130 ක් වශයෙන් සේවකයින් 3,401 ක් බඳවා ගැනීමට 2017 ඔක්තෝබර් 17 දින අරමුදලේ පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දින වනවිට බඳවාගෙන තිබුණු මුළු සේවක සංඛ්‍යාව පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) 713 ක් සහ මුරකරුවන් 376 ක්ද වශයෙන් එකතුව 1089 ක් විය. එම සේවකයන් සඳහා වැටුප් හා වේතන වශයෙන් රු.479,356,993 ක් ගෙවා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වනවිට පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) සහ මුරකරුවන් 1415 ක් සඳහා වැටුප් හා වේතන වශයෙන් රු.582,188,826 ක් ගෙවා තිබුණි. | එකඟ වෙමි | රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් වෙනුවෙන් බඳවාගැනීමෙන් වැළකීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | පොළොන්නරුව ව්‍යාපෘතියේ සේවය කරන නිළධාරීන් 13 දෙනෙකු එම ව්‍යාපෘතියේම අවුරුදු 20 සිට අවුරුදු 26 ක් අතර කාල පරාසයක් තුල අඛණ්ඩව සේවය කරන බව නිරීක්ෂණය වු අතර ඉන් 12 දෙනෙකු ආරක්ෂක නියාමකයින් වු අතර අනෙක් නිළධාරිනිය ප්‍රධාන ප්‍රවේශපත් අලෙවි නිළධාරිනියක් විය. | පිළිතුරු එවා නොමැත | අරමුදලේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් වන පරිදි වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට කළමණාකරනය වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(එ)** | අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ නොමැති ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ තනතුරක් සඳහා නිලධාරියෙකු පත්කර තිබුණු අතර මෙම නිලධාරියා බඳවාගත් 2019 පෙබරවාරි 11 දින සිට 2019 අප්‍රේල් 30 දින දක්වා රු.111,188 වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | පිළිතුරු එවා නොමැත | බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2.9 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශාල සේවක සංඛ්‍යාවක් හා ව්‍යාපෘති සංඛ්‍යාවකින් සමන්විත අරමුදලේ අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 04 ක් වන අතර දැනට අනුමත සේවක සංඛ්‍යාවෙන් වැඩ බැලීමේ පදනම මත සිටින අභ්‍යන්තර විගණකවරයෙකු සහ විගණන නිලධාරීන් දෙදෙනෙකු පමණක් සේවය කරන අතර කළමනාකරණ සහකරුවන් 05 දෙනෙකුද සේවය කරනු ලැබේ. ඒ අනුව ආයතනයේ විෂයපථය ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොමැති බව නිරීක්ෂණය විය. | පිළිතුරු එවා නොමැත | ආයතනයේ විෂයපථය ආවරණය කරගත හැකි පරිදි, අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතුය. |